# දේශීය ආදායම් දෙපාර්තමේන්තුව

## මහජනතාව වෙත කෙරෙන නිවේදනයයි

### 2017 සැප්තැම්බර් මස 07 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද දේශීය ආදායම් කෙටුම්පත් පනත

2017 ජුනි මස 19 වන දින ගැසට් පත්‍රය මගින් ප්‍රසිද්ධ කරන ලද දේශීය ආදායම් කෙටුම්පත් පනත, කාරක සභා අදියරෙහි සිදුකරන ලද සංශෝධන සහිතව 2017 සැප්තැම්බර් මස 07 වන දින පාර්ලිමේන්තුව විසින් සම්මත කර ගන්නා ලද අතර, එය ගරු කථානායකතුමා අත්සන් කිරීමෙන් පසුව පාර්ලිමේන්තුවේ පනතක් බවට පත්වනු ඇත. එම නව පනත **2018 අප්‍රේල් මස 01** වන දින සිට ක්‍රියාත්මක වේ.

බදු ගෙවන්නන්ට තම පරිගණක පද්ධතීන් හි අවශ්‍ය වෙනස්කම් කලින් සිදුකර ගැනීමට හැකිවන පරිදි අදාල පනත ප්‍රසිද්ධ කිරීමෙන් අනතුරුව රෙගුලාසි, උපදෙස් මාලාවන්, පැහැදිලි කිරීම් යනාදිය දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් ලබාදෙනු ඇත. මේ සම්බන්ධ දැනුවත් කිරීමේ වැඩසටහන් දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් පැවැත්වීමට නියමිත අතර, ඒ පිළිබඳ විස්තර ඉදිරියේදී නිවේදනය කරනු ලැබේ.

2006 අංක 10 දරන දැනට ක්‍රියාත්මක දේශීය ආදායම් පනතේ අන්තර්ගත විධිවිධාන 2017/2018 තක්සේරු වර්ෂය සඳහා ද බලාත්මක වනු ඇත.

**වැඩිදුර පැහැදිලි කර ගැනීම් සඳහා දේශීය ආදායම් ඇමතුම් මධ්‍යස්ථානයේ 1944 අංකයට අමතන්න.**

දේශීය ආදායම් වෙබ් අඩවිය - **www.ird.gov.lk**

**දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්**

**බදු - වඩා හොඳ අනාගතයකට**